# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1984 අංක 5 දරන සේවක මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජනවාරි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 20 යි. තැපැල් ගාස්තුව : ශත 60 යි.

## 1984 අංක 5 දරන සේවක මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජනවාරි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 63/81

**1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1984 අංක 5 දරන සේවක මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනතේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— *1979 අංක 32 දරන පනතේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

"කොමසාරිස් වරයා ඡන්ද මණ්ඩලය පත් කළ යුතු බව.

8. 15 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සේවක මණ්ඩලයේ ධුර කාලය ඉකුත් වීමට මාස දෙකකට නොඅඩු කාලය කට පෙර, කොමසාරිස්වරයා විසින්. ඡන්ද මණ්ඩල යක් පත් කරනු ලැබිය යුතුය. ඒ ඡන්ද මණ්ඩලය සුදුසුකම් ලත් සේවා නියුක්තයන් පස් දෙනකු ගෙන් සමන්විත විය යුතු අතර, එයින් එක් සේවා නියුක්තයකු ඒ ඡන්ද මණ්ඩලයේ සභාපති ලෙස පත් කරනු ලැබිය යුතුය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ, (3) වන උපවගන් තියේ, "ඡන්ද මණ්ඩලයක් පත් කරනු ලැබීමෙන් පසු සති හයක කාලයක් ඇතුළත" යන වචන වෙනුවට "ඡන්ද මණ්ඩලයක් පත් කරනු ලැබීමෙන් පසු මාස දෙකක කාලයක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, එහි (3) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(4) කොමසාරිස්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ වූ ඡන්ද විමසීමක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින්, ඒ නිශ්චිත ව්‍යවසායට අලුත් මණ්ඩලයක් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්ය සඳහා නොපමාවම ඡන්ද මණ්ඩලයක් පත් කළ යුතුය".

ඒ 073974 –8,850 (83/12)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.